# විෂය නිර්දේශය

(පළමුවන ප්‍රධාන අවධිය සඳහා)

# ක්‍රියාකාරකම් පාදක වාචික ඉංග්‍රීසි

## දෙවන ශ්‍රේණිය

ප්‍රාථමික අධ්‍යාපන ඒකකය
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
ශ්‍රී ලංකා

2007

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

# විෂය නිර්දේශය

## ක්‍රියාකාරකම් පාදක වාචික ඉංග්‍රීසි - දෙවන ශ්‍රේණිය

### 1.0 හැඳින්වීම

පළමුවන ශ්‍රේණියේ සිට ම සන්නිවේදනය හා අවබෝධය සඳහා ඉංග්‍රීසි භාවිත කිරීමට දිවයිනේ සියලු ම සිසුන්ට සම අවස්ථා ලබා දීම අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වැඩ සටහන යටතේ යෝජනා කර ඇති අලුත් අංගයකි. මෙම නව අංගය ක්‍රියාකාරකම් පාදක වාචික ඉංග්‍රීසි ලෙස හැඳින්වේ. මෙම නාමයෙන් පිළිබිඹු වන පරිදි ම මෙහි දී අවධානය යොමු වනුයේ සිසුන් ක්‍රියාකාරකම් හෝ සැලසුම්ගත සෙල්ලම්වල හෝ යෙදී සිටින අවස්ථාවල දී කතා බහ සඳහා ඉංග්‍රීසි භාවිතය යි. මෙම කාර්යය කළ යුත්තේ පන්ති භාර ගුරුවරයා විසින් ය. විශේෂඥ ගුරුවරයකු යොදා විධිමත් ආකාරයට ඉංග්‍රීසි ඉගැන්වීමක් මෙම අංගය යටතේ අපේක්ෂා නොකෙරේ. විධිමත් ව ඉංග්‍රීසි ඉගැන්වීම තුන්වන ශ්‍රේණියේ දී ආරම්භ කෙරෙනු ඇත. පළමුවන ශ්‍රේණියේ දී හඳුන්වා දුන් මෙම නව අංගය දෙවන ශ්‍රේණියේ සිට තව දුරටත් ඉදිරියට ගෙන යෑම අපේක්ෂා කෙරේ. පළමුවන ශ්‍රේණියේ දී වැඩි අවධානයක් යොමු කරනු ලැබුවේ තනි ඉංග්‍රීසි වචන සහ සරල වාක්‍ය ඛණ්ඩ තේරුම් ගැනීමටත්, උච්චාරණය කිරීමටත් සිසුන් උනන්දු කරවීම සඳහා ය. ඒවාට අමතර ව, දෙවන ශ්‍රේණියේ දී කෙටි සරල ඉංග්‍රීසි වාක්‍ය භාවිතය කෙරෙහි සිසුන් දිරිගැන්වීමට ද අපේක්ෂා කරනු ලැබේ.

පහත සඳහන් ප්‍රධාන අරමුණු මෙම වැඩ සටහන තුළින් සාක්ෂාත් කර ගැනීමට අපේක්ෂා කෙරේ.

- එදිනෙදා ජීවිතයේ දී අවශ්‍ය වන සරල ඉංග්‍රීසි වචන කිහිපයක් නිතර නිතර අසන්නට හා කියන්නට සලස්වා කුඩා වයසේ සිට ම සිසුන් ඉංග්‍රීසි වචනවලට හුරු කිරීම.
- සන්නිවේදනය හා අවබෝධය සඳහා සරල ඉංග්‍රීසි භාවිත වන ඉගෙනුම් පරිසරයක් පන්ති කාමරය හා ඉන් පිටත ඇති කිරීම.
- ඉංග්‍රීසි භාවිතයට සිසුන් තුළ ඇති පසුබටතාව මග හැරවීම.
- තුන්වන ශ්‍රේණියේ සිට විධිමත් ලෙස ඉංග්‍රීසි ඉගෙනීමට ආශාවක් සිසුන් තුළ ඇති වන පරිදි පසුබිම සකස් කිරීම.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපාය

- පළමුවන ශ්‍රේණියේ දී මෙන් ම දෙවන ශ්‍රේණියේ සිසුන්ට ද කතා බහ සඳහා සරල ඉංග්‍රීසි භාවිතය හඳුන්වා දිය යුත්තේ පන්ති භාර ගුරුවරයා විසිනි.

- මේ සඳහා විෂය නිර්දේශයක් සපයනු නොලැබේ. එමෙන් ම, විශේෂ කාල පරිච්ඡේද වෙන් කිරීම ද අවශ්‍ය නොවේ.

- ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ දී ක්‍රියාකාරකම් පාදක වාචික ඉංග්‍රීසි සඳහා අවස්ථා මතු කර ගත ය යුත්තේ සිසුන් පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂයය හා ගණිතය විෂයයට සම්බන්ධ ක්‍රියාකාරකම් හා විනෝදජනක වැඩවල යෙදී සිටින අවස්ථාවල දී පමණි.

- ක්‍රියාකාරකම්වල යෙදෙමින්, තම මව්බසෙන් ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සිදු වන අවස්ථාවන්හි දී සන්නිවේදනය සඳහා සරල ඉංග්‍රීසි භාවිත කළ හැකි අවස්ථා ආයාසයකින් තොරව මතු කර ගැනීමට උත්සාහ කළ යුතු ය.

- සිසුන් ජීවත් වන වටාපිටාවට සමීප නිතර දක්නට ලැබෙන ද්‍රව්‍ය සඳහා යෙදෙන ඉංග්‍රීසි වචන අවස්ථානුකූල ව හඳුන්වා දීම වැදගත් වේ. මීට අමතර ව සරල ඉංග්‍රීසි ක්‍රියාපද, ආමන්ත්‍රණ, විධාන, ආශීර්වාද කෙටි වාක්‍ය යනාදිය නිතර නිතර සිසුන් ඇසෙන්නට සහ කතා කිරීමට සැලැස්වීමත්, ගුරුවරයාගෙන් විශේෂයෙන් බලාපොරොත්තු වේ.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

- සිසුන් සමග නිදහසේ හැසිරෙන විට දී ඔවුනට ඉංග්‍රීසියෙන් ආමන්ත්‍රණය කිරීම, සුබ පැතීම, ආශිර්වාද කිරීම වැනි දේ සිදු කිරීමට අවස්ථා ද මතු වේ. මෙවැනි අවස්ථා ද සරල වාචික ඉංග්‍රීසි හඳුන්වා දීම සඳහා උපයෝගී කර ගත හැකි ය.
- ගුරුවරයාටත් සිසුන්ටත් අමතර බරක් නොවන පරිදි, ප්‍රිය ජනක ලෙස ගුරුවරයා සහ සිසුන් අතරත් සිසුන් සහ සිසුන් අතරත් සන්නිවේදන අවස්ථා ගොඩ නැගීමට සිසුන් උනන්දු කරවීමත් වැදගත් ය.

- එදිනෙදා ජීවිතයේ දී සිසුන්ට නිතර හමු වන ද්‍රව්‍යවල ඉංග්‍රීසි යෙදුම් ඇතුළත් සරල ඉංග්‍රීසි වාග්මාලාවක් ද සරල ක්‍රියාපද, ආමන්ත්‍රණ, විධාන, ආශිර්වාද කිහිපයක් ද වාක්‍ය ඛණ්ඩ සහ සරල වාක්‍ය කිහිපයක් ද මෙහි අවසානයේ ඇතුළත් ය. සිසුන්ට සමීප පරිසරය අනුව මෙම වාග්මාලාවට වචන අලුතෙන් එකතු කිරීමට හෝ අඩු කිරීමට හෝ සුදුසු පරිදි වෙනස් කර ගැනීමට ගුරුවරයාට නිදහස ඇත.

- මෙහි ඉදිරිපත් කර ඇති පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් සහ ගණිත විෂයයන්ට අදාළ ව හඳුන්වා දී ඇති වචන සියල්ලම භාවිත කිරීම අනිවාර්ය නොවේ.

- මීට අමතර ව 2007 වර්ෂයේ සිට ගණිත විෂයයට අදාළ ව ක්‍රියාකාරකම් පාදක වාචික ඉංග්‍රීසි සඳහා වන වාග්මාලාවක් ද පිටු අංක හි ඉදිරිපත් කර ඇත. පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂය මෙන් ම ගණිතය විෂය ඉගැන්වීමේ දී ද උචිත අවස්ථාවල දී ක්‍රියාකාරකම් පාදක වාචික ඉංග්‍රීසි භාවිත කිරීමට අවස්ථාව සැලැස්වීම ගුරුවරයාගේ වගකීමයි.

- ක්‍රියාකාරකම් පාදක වාචික ඉංග්‍රීසි සඳහා විශේෂයෙන් සකසන ලද මොඩියුලයක් ඇත. පරිසර ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂයයේ තේමාවන්ට අනුව කාණ්ඩ කර ඇති වාග්මාලාවක් ද යෝජිත ක්‍රියාකාරකම් තවත් උපදෙස් හා උදවු ද එහි ඇතුළත් කර ඇත. ඉංග්‍රීසි භාෂාවෙන් සකසා ඇති මෙම මොඩියුල ගුරුවරයාගේ කාර්ය භාරය පහසු කර ලීමට සමත් වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

- නිවැරදි ව ඉංග්‍රීසි වචන උච්චාරණය කිරීම පිළිබඳ ව සැලකිලිමත් වන්න. අවශ්‍ය වේ නම් මේ සඳහා පාසලේ ඉංග්‍රීසි උගන්වන ගුරුවරයාගේ සහ ඉංග්‍රීසි ගුරු උපදේශකවරුන්ගේ උපදෙස් ලබා ගත හැකි ය. එමෙන් ම, ප්‍රාදේශීය ඉංග්‍රීසි උපකාරක මධ්‍යස්ථානවල (Regional Education Support Centres) සේවය ද ලබා ගෙන ගුරුවරයාගේ ඉංග්‍රීසි දැනුම වර්ධනයට ද මේ තුළින් අවස්ථා සලසා ගැනීම අපේක්ෂා කෙරේ.

විශේෂයෙන් සැලකිය යුතු කරුණු කිහිපයක්

- ක්‍රියාකාරකම් පාදක වාචික ඉංග්‍රීසි හඳුන්වා දීමේ ක්‍රියාවලිය යටතේ
  - විධිමත් ඉංග්‍රීසි ඉගැන්වීමේ ක්‍රම භාවිතය අපේක්ෂා නොකෙරේ.
  - ඉංග්‍රීසි හෝඩියේ අකුරු ඉගැන්වීම, ඉංග්‍රීසි වචන ලිවීමට හෝ කියවීම ඉගැන්වීම අපේක්ෂා නොකෙරේ.
  - විශේෂ පොත්පත් භාවිතය අවශ්‍ය නොවේ.

- ක්‍රියාකාරකම් පාදක වාචික ඉංග්‍රීසි හඳුන්වා දීමේ ක්‍රියාවලියෙන් මව්බස හා ගණිතය විෂයයන්ට අදාළ මූලික සංකල්ප වර්ධනයට කිසිදු බාධාවක් සිදු නොවිය යුතු ය.

- පාසල් සංස්කෘතියට හෝ ජාතික සංස්කෘතියට කිසිදු අහිසි බලපෑමක් මෙම ක්‍රියාවලිය තුළින් සිදු නොවීමට ගුරුවරුන් විශේෂයෙන් වග බලා ගත යුතු ය.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.